# එ ජා පක්ෂය ෆෙඩරල් අත්හැරියේ සිංහලයන් රැවටීමට ද?

පසුගිය සතියේ අපට අවශ්‍ය වුයේ කොටි සංවිධානය සමග තවදුරටත් සාකච්ඡා අවශ්‍ය නැත්තේ ඇයි ද යන්න විස්තර කර සන්ධීය රාජ්‍යය මෙරටට වලංගු නොවන සංකල්පයක් බව පෙන්වීමට ය. එහි දී අපි එක්සේසත් රාජ්‍යය පිළිබඳ සාකච්ඡාවක් ද ඇරඹුවෙමු. එහි අදහස වුයේ අතීතයේ මෙරට බලය ජනතාව අතට එක් එක් තලයෙන් තලයට ගෙනගියේ කෙසේ දැයි පෙන්වාදීමට ය. පසුගිය සතියේ නැවැත්වූ තැන සිට මේ සතියේ ලිපිය ඇරඹීමේ අපහසුතාවක් පැන නැගී ඇත. එයට හේතුව එ ජා පක්ෂය සන්ධීය රාජ්‍යය පිළිබඳ තම ස්ථාවරය ඔවුන් සඳහන් කරන ආකාරයට නම් නැවත සකස්කර ගැනීම ය.

පසුගිය බදාදා හදිසියේ ම මෙන් පක්ෂයේ විධායක හා දේශපාලන මණ්ඩලවල සාකච්ඡා නොකරම එ ජා පක්ෂය මෙරට සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයක් පිහිටුවිය යුතු ය යන ස්ථාවරය වෙනස්කරන බව පැවසී ය. දැන් එ ජා පක්ෂය ද ඒකීය රාජ්‍යයක බලය බෙදීමට එකඟ ය. ඒ පක්ෂය එවැනි ස්ථාවරයකට තල්ලු වුයේ කෙසේ ද? මංගල සමරවීර මහතා එ ජා ප තීරණයෙන් තවදුරටත් අසරණ වී ඇත් ද? සුදු නෙළුම් අතින් ගෙන සන්ධීය රාජ්‍යයක් පිහිටුවීමට තවලම් ගිය සමරවීර මහතාට ද දැන් ඒකීය රාජ්‍ය ස්ථාවරයට මාරුවීමට සිදුවේ ද? එයටත් වඩා චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට කුමක් සිදුවේ ද?

එ ජා පක්ෂය සන්ධීය ස්ථාවරය අත්හැරීමට තීරණය කෙළේ අව්‍යාජව යැයි අපි මොහොතකටවත් නො සිතමු. එ ජා පක්ෂය පමණක් නොව ඒකීය රාජ්‍යයක් වෙනුවෙන් පෙනී සිටින වෙනත් ඇතැම් පක්ෂ ද එසේ කරන්නේ අව්‍යාජ ව නොවන බව අපි දනිමු. ඒ ඒ පක්ෂ හා ඒ ඒ පක්ෂවල මූලාදර්ශන (ප්‍රොටෝටයිප්) හෙවත් පූර්වගාමීන් ඒ ඒ කාලවල දැරූ ස්ථාවර සාකච්ඡාකර තුවාල පෑරීමට අපි අදහස් නො කරමු. සිංහලයන් අතර ක්‍රියාකරන සිංහලයන්ගේ ඡන්දයෙන් බලය ගැනීමට  බලාපොරොත්තුවන දේශපාලන පක්ෂවලට ජාතිකත්වය සම්බන්ධයෙන් කලක් ගත වී හෝ සුළු කලකටවත් සිංහලයන්ගේ මතය පසුපස යෑමට සිදුවීම මෙරට දේශපාලනයේ ලක්ෂණයක් වී ඇත.

මෙයට හේතුව සිංහලයන්ගේ ජාතිකත්වය ඇතැම් ඉතිහාසඥයන් පසුගිය කාලයේ බෙරිහන්දීමට උත්සාහ කළ ආකාරයට නොව අවුරුදු දහස් ගණනකට පෙර ඇතිවීම ය. පණ්ඩුකාභය රජතුමාගේ කාලයේ දී ඇති වූ ජාතිකත්වයක් සිංහලයන් සතුවෙයි. බලයට ඒමට කිසිම බලාපොරොත්තුවක් නැති එහෙත් විදේශික මුදලින් තම පැවැත්ම සඳහා දේශපාලනය කරන කසිකබල් මාක්ස්වාදී පක්ෂවලට නම් සන්ධීය ස්ථාවරයේ දිගට ම රැඳී සිටිය හැකි ය. එහෙත් අඩුම තරමින් ඇමති ධුරයක්වත් බලාපොරොත්තුවෙන් සිටින දේශපාලන පක්ෂයකට සිංහලයන් අතර මේ මොහොතේ දේශපාලනය කළ හැක්කේ සන්ධීය ස්ථාවරය අත්හැරීමෙන් පසුව ය. අඩුම තරමින් සිංහලයන් රැවටීමටවත් සන්ධීය රාජ්‍යය සංකල්පය අත්හැරිය යුතු ය.

මහසෙන් රජු මහාවිහාරය විනාශකළ නමුදු ඔහුට වැඩිකල් නොගොස් ම තම වරද නිවැරදිකර ගැනීමට අවුරුදු එක්දහස් පන්සීයකට පමණ පෙර සිදු වුයේ සිංහලයන් අතර ඒ වන විටත් සිංහල ජාතිකත්වයක් ගොඩනැගී තිබුණු බැවිනි. ජාතිකත්වය රාජ්‍යයක් සමග බද්ධ වෙයි. සිංහල ජාතිකත්වය ගොඩනැගීමේ දී බලපෑ ප්‍රධාන සාධකය වුයේ පණ්ඩුකාභය රජතුමාගේ එක්සේසත් රාජ්‍යය ය. ජාතිකත්වයක් ගොඩනැගීමට ප්‍රබල නායකයකු හා රාජ්‍යයක් අවශ්‍ය වෙයි. එහෙත් ජාතිකත්වය ගොඩනැගුණු පසු නායකයන්ට (රජු , මැති  ඇමතිවරු ආදීන්ට) යම් ප්‍රමාණයකට හෝ ජාතිකත්වය පසුපස යෑමට සිදුවෙයි. සිංහලයන් අතර බලය ලබාගැනීම සඳහා දේශපාලනයෙහි යෙදෙන දේශපාලන පක්ෂවලට කලක් ගතවී සුළු කාලයකට වුව ද  ජාතිකත්වය පසුපස යෑමට සිදුවෙයි.

එහෙත් ලංකාවේ දෙමළ හා මුස්ලිම් ජනයා අතර ගොඩනැගුණු ජාතිකත්වයක් නැත. වෙල්වනායගම් මහතා හා අෂ්රොෆ් මහතා ඒ ඒ ජනකොටස් අතර එවැනි ජාතිකත්වයක් ගොඩනැගීමට උත්සාහ කළ නමුදු විවිධ හේතු නිසා ඒ කරගත නො හැකිවිය. ප්‍රභාකරන් ද උත්සාහ කෙළේ දෙමළ ජනයා අතර ජාතිකත්වයක් ගොඩනැගීමට ය. එහි දී රාජ්‍යය යන්න ඉතා වැදගත් වෙයි. ජාතිකත්වය හා රාජ්‍යය අතර ඇත්තේ මහත් බැඳීමකි. මේ බැඳීම යුරෝපයේ ජාතික රාජ්‍යය බිහිවීමෙන් ද පැහැදිලි වෙයි. එහෙත් යුරෝපීය ආකෘතියට අදාළ නොවන රාජ්‍යයක ද ජාතිකත්වයක්

© Prof. Nalin De Silva

ඇතිකළ හැකි බව පණ්ඩුකාභය රජතුමා උගන්වා බොහෝ කල් ය. ඒ බව යුරෝපීය දේශපාලන විද්‍යාඥයන් අවබෝධ කර නොගත් පමණින් ඇතැම් ඉතිහාසඥයන් හා දේශපාලනඥයන් අනුව යමින් සිංහල ජාතිකත්වය ඇතිවුයේ මෑත කාලයේ දී යැයි කිවයුතු නො වේ. පණ්ඩුකාභය රජු රාජ්‍යය අත්පත් නොකරන්නට සිංහල ජාතිකත්වයක් ගොඩ නැගීම පමාවීමට තිබුණි.

වෙල්වනායගම් මහතා මෙන් ම ප්‍රභාකරන් ද වෙන ම දෙමළ රාජ්‍යයක් ඇතිකිරීමට කටයුතු කෙළේ හා කරන්නේ ද ජාතිකත්වය හා රාජ්‍යය අතර ඇති සම්බන්ධය හේතුකොටගෙන ය. අෂ්රොෆ් මහතා එයට වඩා වෙනස් මගක් ගත්තේ ය. ඔහුට අවශ්‍ය වුයේ ලංකාවට වෙන ම ජාතිකත්වයක් ගොඩනැගීමට ය. ලංකාවේ සිංහල ජාතිකත්වය නැතිකර මුස්ලිම් ජාතිකත්වයක් ඇතිකිරීම ඔහුගේ අවශ්‍යතාව විය. ඔහු විසින් ජාතික සමගි සංධානය ගොඩනගනු ලැබුයේ ද ඒ අවශ්‍යතාව උදෙසා ය. ලංකාවේ එක් ප්‍රදේශයක පමණක් මුස්ලිම් රාජ්‍යයක් ගොඩනැගීම සඳහා කිසිම විභවයක් නැත. වෙල්වනායගම් මහතා දෙමළ රාජ්‍යයක් ගොඩනැගීම සඳහා කෘත්‍රිම ව උතුරු පළාතට නැගෙනහිර පළාත ද යා කරගත්තේ දෙමළ කතාකරන  ජනයා නමින් සංකල්පයක් තනා ඒ ඔස්සේ මුස්ලිම් ජනයා ද තම පක්ෂයට එකතුකර ගනිමිනි. ඒ ව්‍යාපෘතියේ තිබියේ මුස්ලිම් ජනයා දෙමළ ආධිපත්‍යයක් යටතට ගැනීම බව අෂ්රොෆ් මහතා අවබෝධ කරගත්තේ ය. එහෙත් මුස්ලිමුන්ට පමණක් වු රාජ්‍යයක් ගොඩනගා ගැනීමට නොහැකි බව ඔහුට තේරුම් යන්නට ඇත. ඔහු ලංකාවට ම මුස්ලිම් ජාතිකත්වයක් සැපයීමේ කටයුත්ත කරට ගත්තේ එබැවිනි. එය කළ නොහැක්කක් බව තේරුම්ගැනීමට ඔහු ජීවත් නො වීය. දෙමළ ජාතිකත්වයට යටත් නොවු මුස්ලිම් ජාතිකත්වයක් ඇතිකිරීමට දෙමළ ජාතිවාදීන් හෝ බටහිරයන් හෝ ඉඩ දේවි යැයි බලාපොරොත්තු විය යුතු නො වේ.

කෙසේ වෙතත් අද මෙරට දෙමළ හා මුස්ලිම් ජාතිකත්ව කිනම් ආකාරයකට හෝ ගොඩනැගීමට නොහැකි බව සියළු දේශපාලන පක්ෂවලට වැටහිය යුතු ය. ඒ සඳහා රාජ්‍ය පිහිටුවීම තබා සන්ධීය රාජ්‍යයකටවත් මෙරට ඉඩක් නැති බව බලය (අඩුම තරමින් ඇමතිකමක්)  ලබාගැනීමට අවශ්‍ය දේශපාලන පක්ෂව අද තේරුම්ගත යුතුව ඇත. එ ජා පක්ෂය කල් පසු වී හෝ සන්ධීය ස්ථාවරය අත්හැර ඇත. එහෙත් ඒ සිංහලයන්ගේ යහපතට ද? එ ජා පක්ෂය මෙවැන්නක් කළ පළමු අවස්ථාව මෙය නො වෙයි. 1956 මැතිවරණයට පෙර එවකට අගමැති වු ජෝන් කොතලාවල මහතා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව විය යුතු යැයි පිළිගත්තේ ජනතා කැමත්තට හිස නමමිනි. එහෙත් ජනතාව එ ජා පක්ෂයට ඡන්දය නො දුන්හ. කෙසේ වෙතත් 1956 දී ශ්‍රී ල නි පක්ෂය මෙන් ම එ ජා පක්ෂය ද සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කිරීම වෙනුවෙන් පෙනී සිටියේ ය. එහෙත් පසුව ඒ සියල්ල වෙනස්කිරීමට විදේශීය බලවේගවලට හැකිවිය.

ලංකාවේ පමණක් නොව ථෙරවාදී සංස්කෘතියක් ඇති රටවල දේශපාලනයේ දී විදේශීය විජාතික බලවේග තීරණාත්මක කටයුත්තක් ඉටුකරයි. එ ජා පක්ෂය යනු මෙරට විජාතික බලවේගවල ප්‍රධාන නියෝජිතයා ය. දේශීය වශයෙන් ගත්කල සන්ධීය ස්ථාවරය අත්හැරීමට එ ජා පක්ෂයට තාවකාලිකව වුව ද සිදු වී ඇත. එහෙත් ඒ කොපමණ කාලයකට දැයි අපි නො දනිමු. මේ සියල්ල කෙරෙන්නේ අවසානයේ දී සර්වපාක්ෂික නියෝජිත කමිටුව ඔස්සේ ඒකීය නමින් ෆෙඩරල් නෙවත් සන්ධීය රාජ්‍යයක් ඇතිකිරීම සඳහා විය හැකි ය. සන්ධීය අදහසක් දෙන ලෙස නිර්වචනය කළ ඒකීය වචනය සහිතව, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් ව්‍යවස්ථාව සංශෝධනය කර සිංහල ජනතාව රැවටීමේ සූදානමක් එ ජා පක්ෂයට, බටහිර රටවලට හා කසිකබල් මාක්ස්වාදීනට වේ ද? අපි විමසිල්ලෙන් පසුවෙමු. බලය ජනතාව අතට පත්කිරීම යන්න අපේ පැරණි එක්සේසත් රාජ්‍යයට ආගන්තුක වුවක් නො වී ය. එකල ඇතැම් බලයක් ගම් මට්ටම දක්වා ම විහිදිණි. අපි අද බලය විමධ්‍යගත කිරීම (ඩිසෙන්ට්‍රලයිසේෂන්), සාරෝපණය (ඩෙවොලූෂන්) ආදී බටහිර සංකල්පවල සිර වී සිටිමු. එහෙත් අපේ සංකල්පවලට එක රැයකින් අනෙක් අය ඇද ගැනීමට හැකිවේ යැයි අපි නොසිතමු. එක්සේසත් රාජ්‍යයක දේශපාලනඥයන් මෙන් ම නිලධාරීන් ද මගහැර තීරණ ගැනීමට ජනතාව බලය දීම යන්න අනාගතයට අයත් ව්‍යාපෘතියක් වෙයි. එතෙක් ඒකීය රාජ්‍යයක විවිධ ජාතිකත්වවලට ඉඩ නොදී බලය බෙදීම යන සංකල්පය මත කටයුතුකිරීමට අපට සිදුවෙයි. ජාතිකත්වය යන්නට රාජ්‍යයක් යන සංකල්පය ද බැඳී ඇත. අද බලය බෙදීමේ දී අපට සැලකීමට ගැනීමට සිදුවන්නේ ඒ ඔස්සේ දෙමළ ජාතිකත්වයක් හෝ මුස්ලිම් ජාතිකත්වයක් හෝ ඇතිකිරීමේ දිශාවකට යෑමට සුළුවෙන් හෝ ඉඩක් තිබේ ද යන්න ය. සන්ධීය යන්නෙහි එවැනි ඉඩක් වෙයි. එබැවින් අපි ඒකීය නමින් සන්ධීය රාජ්‍යයක බලය බෙදීමට ද විරුද්ධ වෙමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva